සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## පෙරදිග සංගීතය - I

**13 ශ්‍රේණිය** | **කාලය පැය 02 යි.**

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. (අංක 01 සිට 50 දක්වා)
- වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

---

(01) පූර්වාංගවාදී රාග යුගලයක් වන්නේ,

(1) හමීර් ජෞනපුරි (2) ජෞනපුරි මාල්කෞන්ස් (3) බහාර් හමීර්
(4) ආශාවරී දේශ් (5) දේශ් තිලක්කාමෝද් (......)

(02) බහාර් රාගයට අනුව ත්‍රිතාලය මත නිර්මාණය වී ඇති නිවැරදි ස්වර වන්නේ,

(1) ග ම ධ ප | ප ම′ප | රි ග ම | ධ ම′ප
(2) නි සං රිං නි | සං <u>නි</u> | ප ග <u>ම</u> | ධ නි ස
(3) ස <u>නි̣</u> ධ̣ නි̣ | ස ම | <u>ග</u> ම <u>ධ</u> ම | <u>ග</u> ස
(4) නි̣ ස රි ම | ප නි සං | නි̣ ස රි ග | ස
(5) ස රි ම ප | <u>ධ</u> සං | <u>ධ</u> ප | ම ප <u>ධ</u> <u>ග</u> (......)

(03) ඛ්‍යාල්, තරාණා, සර්ගම්, ත්‍රිවට් යන අංග හතර යෙදෙන ගායන ශෛලිය වන්නේ,

(1) භක්ති ගී (2) භජන් (3) චතුරංග (4) ගසල් (5) කුම්රි (......)

(04) රාගධාරී සංගීතයේ දී වනාදනයට පමණක් සුවිශේෂී වූ ශිල්පාංගයකි,

(1) තිහායි (2) කන් (3) මුඛඩා (4) උපජ් (5) ගමක් (......)

(05) සං, පධමග, සරිගසනි̣ යනුවෙන් අවරෝහණය යෙදෙන රාගයේ,

(1) මේලය බමාජ වේ. (2) ගානසමය දිවා දෙවන ප්‍රහරය වේ.
(3) වාදි ප සංවාදි ස වේ. (4) ජාතිය ඖඩව සම්පූර්ණ වේ.
(5) ම විවාදි ස්වරයක් ලෙස භාවිතා වේ. (......)

(06) ගීතය වඩාත් අලංකාරවීම සඳහා සම, දෙගුණ, සිව්ගුණ වශයෙන් ගුණ කරමින් ගායනා කරන හින්දුස්ථානි ගායන ශෛලියකි,

(1) ගසල් ගීත (2) තරාණා ගීත (3) ධ්‍රැපද් ගීත (4) සර්ගම් (5) ඛ්‍යාල් ගී (......)

(07) එකම ස්ථානයේ පහළ ඉහළ ස්වර නිපදවිය හැකි භාණ්ඩය වන්නේ,

(1) වයලීනය (2) එස්රාජය (3) සිතාරය (4) තබ්ලාව (5) බටනලාව (......)

www.artsapi.lk

(08) ''සම්භාව්‍ය තාලදීපනී'' ග්‍රන්ථයේ කතුවරයා වන්නේ,

(1) විජේරත්න රණතුංග (2) සනත් නන්දසිරි (3) ආනන්ද ජයසිංහ

(4) චානක පීරිස් (5) ඩී.ආර්. පීරිස් (......)

(09) මාල්කොනිස් රාගයේ මේලය නම්,

(1) භෛරවී (2) කල්‍යාණ (3) ආශාවරී (4) භෛරව (5) කාෆි (......)

(10) ගීතයක හෝ වාදිතයක ආරම්භයේ සිට සමග්‍රහය දක්වා ඇති කොටස හඳුන්වන්නේ,

(1) මුඛඩා යනුවෙනි. (2) ආවර්තයක් යනුවෙනි. (3) විභාගයක් යනුවෙනි.

(4) තිහායි යනුවෙනි. (5) උපජ් යනුවෙනි. (......)

(11) දක්ෂිණ භාරතීය සංගීතය තුළ භාවිතාවන ප්‍රධාන භාණ්ඩ යුගලය වන්නේ,

(1) බටනලාව තාලම්පට (2) වීණාව බටනලාව (3) ෂෙනායි වීණාව

(4) සිතාරය සටම් (5) මෘදංගය වීණාව (......)

(12) තීලවඩා හා ත්‍රිතාලයට අයත් මාත්‍රා සංඛ්‍යාව පිළිවෙලින් දක්වන්න.

(1) 15 16 (2) 14 16 (3) 16 15 (4) 16 16 (5) 14 16 (......)

(13) නා, තා, රේ, දිම්, තදිම් වැනි අර්ථ ශූන්‍ය වචන භාවිතා වන හින්දුස්ථානි ගායන ශෛලියට සමාන කර්ණාටක ගායන විශේෂයක් වන්නේ,

(1) පදම් (2) තිලානා (3) වර්ණම් (4) කීර්තනම් (5) තිර්වට් (......)

(14) සංධවනි සම්බන්ධයෙන් නොගැලපෙන කියමන තෝරන්න.

(1) ස්වර සංවාද බහුලව තිබීම.

(2) නාද මාධ්‍යයෙන් හැඟීම් ප්‍රකාශනය.

(3) සමූහ වාදනයට වඩා ඒකල වාදනයට මුල්තැනක් හිමිවීම.

(4) වයලින් පවුලේ සියළුම භාණ්ඩ යොදා ගැනීම.

(5) විවිධ හැඩතල භාවිතය. (......)

(15) සරි මප රිම පධ මප ධනි පධ නිස් මෙම තානාලංකාරය අයත්වන රාගය,

(1) ජෞනපුරී (2) මාල්කෞන්ස් (3) ආශාවරී (4) බහාර් (5) දේශ් (......)

- **අංක 16 - 20 දක්වා වූ ප්‍රශ්න වලට පිළිතුරු පහත (ආ) තීරුවෙන් තෝරා (අ) තීරුව ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

| | (අ) | | | (ආ) |
|---|---|---|---|---|
| (16) | තබ්ලාව | (........) | (i) | දි කුං තාකු දොං |
| (17) | මද්දලය | (........) | (ii) | දොංජි / ජිගත |
| (18) | ගැටබෙරය | (........) | (iii) | තකදීම් / තකජොනු |
| (19) | මෘදංගය | (........) | (iv) | කිතිනා /ධින / ධින |
| (20) | දවුල | (........) | (v) | ජෙං කිටිතහ් / තක් කිටි තක |

www.artsapi.lk

- **අංක 21 - 25 දක්වා වූ ප්‍රශ්න වල හිස්තැනට සුදුසු වචනය ලියා දක්වන්න.**

බටහිර සංගීතයේ දෙදෙනෙකු අතර වන වාදන ප්‍රයෝගය (21) ................................................ නමින් හැඳින්වෙන අතර, ඇල්ටෝ, ටෙනර් (22) ................................................ , (23) ................................................ වශයෙන් භාවිතා වන හැඬතල 4 කි. දේශීය නූර්ති, නාඩගම් වලට සමාන බටහිර නාට්‍ය විශේෂය (24) ................................................ නමින් හැඳින්වේ. බේතෝවන් මෙන්ම (25) ................................................ ද සංධවනි නිර්මාණයේ මහත් ප්‍රසිද්ධියක් උසුලයි.

(26) සබරගමු ශාන්තිකර්ම වලට අයත් ගීතයකි,

(1) සුරතට රැගෙන (2) ගුණ දූනේ බෝසත් අනේ (3) ඇත එපිට දීපංකර
(4) ඉන්ද්‍ර දිසාවට (5) සිරිවස ගෙන අසු (......)

(27) අනාඝාතාත්මක මෙහෙ ගීයකට උදාහරණයකි,

(1) මාල් මාල් මල් මල් (2) බෝගම්බර අපි නෙලුමට යන විට
(3) පැහැසරණිය මිණි පැමිණිය (4) මොහු හැරවෙන දම්
(5) අම්මපල්ලා බඹරුගෙ අත (......)

(28) ටීකා සිව්පද වල විශේෂත්වය වන්නේ,

(1) සී පද අතරට වෙනත් නාද මාලාවක් එක් කිරීම.
(2) සී පද අතරට දෙබස් එක් කිරීම.
(3) සී පද පමණක් ගායනා කිරීම.
(4) ගද්‍යමය පාඨයක් පමණක් කිරීම.
(5) සී පද අතරට ගද්‍යමය කොටසක් කිරීම. (......)

(29) උරුට්ටුව නමැති කොටස ඇතුලත් වන නාට්‍ය ශෛලිය වන්නේ,

(1) නූර්ති (2) කව්වාලි (3) නාඩගම් (4) නව නාට්‍ය (5) කෝලම් (......)

(30) මාල්කෞන්ස් රාගය ආශ්‍රිත සරල ගීතයකි,

(1) මම දෙව්දුනි (2) හංසරාජිනී (3) හෝපළු වන පෙත
(4) කළිඳු ගංගා (5) ගුමු ගුමුව වදුලේ (......)

- **අංක 31 - 40 දක්වා වූ ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.**

(31) පහතරට බෙරය වාදනය සඳහා යොදා ගන්නා අවස්ථා 02 ක් ලියන්න.

....................................................................................................................................................

(32) බහාර් රාගයට අයත් සර්ගමයේ මුල් පාදය ලියන්න.

....................................................................................................................................................

(33) නිර්දේශිත ඖඩව සම්පූර්ණ රාග 02 ක් නම් කරන්න.

....................................................................................................................................................

www.artsapi.lk

(34) හින්දුස්ථානි රාග ආශ්‍රිතව නූර්ති ගී නිර්මාණය වූ බව දැක්වීමට නිදසුන් 02 ක් දක්වන්න.

..........................................................................................................................................................

(35) පැරණි සාම ගීත ගායනා කළ ස්වර තුනෙන් දෙකක් නම් කරන්න.

..........................................................................................................................................................

(36) මානසවිල ඔපෙරාව නිර්මාණය කළේ කවුරුන් විසින් ද?

..........................................................................................................................................................

(37) සංධ්වනියක දක්නට ලැබෙන ලක්ෂණ 02 ක් සඳහන් කරන්න.

..........................................................................................................................................................

(38) කෝලම් නාට්‍යයේ එන චරිත 02 ක් ලියා දක්වන්න.

..........................................................................................................................................................

(39) රාජසභාව හා සම්බන්ධ මහනුවර යුගයේ තිබූ සංගීත ආයතන 02 ක් දක්වන්න.

..........................................................................................................................................................

(40) වැදි ගී ආශ්‍රය කොට නිර්මාණය වූ සරල ගීත 02 ක් ලියා දක්වන්න.

..........................................................................................................................................................

- **අංක 41 - 50 දක්වා දී ඇති ප්‍රකාශ වල වැරදි නිවැරදිභාවය දක්වන්න.**

(41) ජයජයවන්ති රාගය බිලාවල් මේලයට අයත් වේ. (........)

(42) ඒක්තාලයේ සිව්වන මාත්‍රාවේ පිහිටා ඇත්තේ කත් යන අක්ෂරයයි. (........)

(43) ම නි ධ නි සං යනු බිහාග් රාගයේ සංගතියකි. (........)

(44) විකාරි යනු සිතාරයේ ප්‍රධානතම ස්වරයයි. (........)

(45) කෝමල ස්වර එකක් පමණක් යෙදෙන මේජර් ස්කේලය නම් F Flat M Scale ය. (........)

(46) කෝලම් නාට්‍යයේ රංග භූමිය වන්නේ කරලියයි. (........)

(47) සායනය වාදනය සඳහා රාජ අනුග්‍රහය නොමඳව ලබාදුන් මහනුවර යුගයේ සිටි රජෙකි දෙවන වන පරාක්‍රමබාහු. (........)

(48) ෂඩ්ජයේ සිට පංචමය දක්වා ඇති කළු යතුරු සංඛ්‍යා 02 කි. (........)

(49) ස්වර දෙකක් ඉහළින් වක්‍රාකාර ඉරකින් සම්බන්ධ කිරීම මීන්ඩ් නම් වේ. (........)

(50) ත්‍රිතාලයට ගැළපෙන හින්දුස්ථානි තාල රූපය වන්නේ Three Four time 3/4 ය. (........)

www.artsapi.lk

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# පෙරදිග සංගීතය - II

**13 ශ්‍රේණිය** **කාලය පැය 03 යි.**

- I කොටසින් ප්‍රශ්න දෙකකටද, II කොටසින් එක් ප්‍රශ්නයකටද, III කොටසින් ප්‍රශ්න දෙකකටද පිළිතුරු සපයන්න.

---

## I කොටස

01. (i) නිර්දේශිත රාගවලට අයත් ස්වර ඛණ්ඩ කිහිපයක් පහත දැක්වේ. එම රාග හඳුන්වන්න.

(a) ම′ ප ධ ප, ග ම ධ ප, ග ම රි ස

(b) ම ප ධ̲ නි̲ ස̲̇, නි̲ නි̲ ධ̲ ප, ම ග̲ රි ස

(c) ග̲ ම ධ̲ නි̲ ස̇, ම ධ̲ නි̲ ධ̲ ම, නි ස̇ ග̇ ස̇

(d) රි ම රි ස, ප ම රි, ස රි නි̣ ස (ල.04)

(ii) (c) කොටසට අයත් රාගයේ මධ්‍යලය ගීතය ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල.06)

(iii) (a) කොටසට අයත් රාගයේ රාග විස්තරය ලියා දක්වන්න. (ල.06)

(iv) (d) කොටසට අයත් රාගයට අදාළව තානාලංකාර (මාත්‍රා 16) 02 ක් ලියන්න. (ල.04)

02. නිර්දේශිත රාග කිහිපයකට අදාළ කරගත හැකි තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

(a) ම, ස වාදි සංවාදි වන ඖඩව ඖඩව ජාති රාගය

(b) ධ̲, ග̲ වාදි සංවාදි වන ෂාඩව සම්පූර්ණ ජාති රාගය

(c) ම, ස වාදි සංවාදි වන ෂාඩව ෂාඩව ජාති රාගය

(d) ධ, ග වාදි සංවාදි වන සම්පූර්ණ ජාති රාගය

(i) ඉහත එක් එක් රාගය හඳුන්වන්න.

(ii) (a) කොටසට අයත් රාගයට අදාළ ස්වර 30 කට නොඅඩු ආලාප ඛණ්ඩයක් නිර්මාණය කරන්න.

(iii) (c) කොටසට අයත් රාගයේ සර්ගමය ප්‍රස්තාර කරන්න.

(iv) (b) කොටසට අයත් රාගයේ ස්වර අභ්‍යාස 02 ක් ආරෝහණ අවරෝහණ වශයෙන් ගොඩනගන්න.

03. භාරතීය සංගීතයේ විවිධ ගායන ශෛලීන් පිළිබඳව දැනුවත්වීම සංගීතය හදාරන සිසුන්ට ඉතාමත් වැදගත් වේ.

(i) ධ්‍රැපද් ධමාර් ගායන ශෛලීන් පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ල.08)

(ii) කර්ණාටක ගායන ශෛලියක මුල් කොටසක් ප්‍රස්තාර කරන්න. (ල.06)

(iii) ධ්‍රැපද් ධමාර් ගායන ශෛලීන් ගැයීමට යොදා ගන්නා තාල දෙක නම් කර එම තාල දෙක සම දෙගුණ වශයෙන් ප්‍රස්තාර කරන්න. (ල.06)

www.artsapi.lk

## II කොටස

04. (i) ආඝාතාත්මක අනාඝාතාත්මක වශයෙන් දේශීය ගී දෙවර්ගයක් බිහිවීමට හේතු සාධක දක්වමින් එම ගී දෙවර්ගය විස්තර කරන්න. (ල.08)

(ii) අනාඝාතාත්මක මෙහෙ ගීයක මුල් පද දෙක ප්‍රස්තාර කරන්න. (ල.04)

(iii) ආඝාතාත්මක ශාන්තිකර්ම ගීතයක් ස්වරද සමඟ ප්‍රස්තාර කරන්න. (ල.04)

(iv) ඉහත ඔබ ප්‍රස්තාරය කළ ආඝාතාත්මක ගීය සඳහා වැයීමට සුදුසු බෙර පදය ප්‍රස්තාර කරන්න. (ල.04)

05. (i) සොකරි හා කෝලම් රංග සම්ප්‍රදායන් පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කරන්න. (ල.08)

(ii) ඉහත එක් රංග සම්ප්‍රදායකට අයත් ප්‍රචලිත ගීයක මුල් කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල.04)


(iii) ඉහත රංග ශෛලීන් දෙකට අමතරව වෙනත් රංග ශෛලීන් 02 ක් නම් කර එකකට අයත් නාට්‍යමය හා සංගීතමය ලක්ෂණ පැහැදිලි කරන්න. (ල.08)

## III කොටස

06. (i) බැලේ සහ ඔපෙරා දෙකෙහි සමානකම් මෙන්ම වෙනස්කම් පිළිබඳ සංසන්දනාත්මක අදහස් ඉදිරිපත් කරන්න. (ල.07)

(ii) සංධ්වනියක දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ 06 ක් ලියා දක්වන්න. (ල.06)

(iii) සංධ්වනි නිර්මාපකයින් දෙදෙනෙකු පිළිබඳ ජීවන තොරතුරු හා ඔවුන් සංගීත ක්ෂේත්‍රයට සිදු කළ සේවාවන් පිළිබඳ පහදන්න. (ල.07)

07. 

(i) ඉහත බටහිර ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට අනුව ලියා දක්වන්න.

(ii) ඊට ගැලපෙන Time Signature යොදන්න.

(iii) එම ප්‍රස්තාරය අයත් ගීත විශේෂය කුමක් ද? (ල.20)

08. (i) මහනුවර යුගයට දකුණු ඉන්දීය බලපෑම එල්ලවීමට බලපෑ සාධක මොනවා ද?

(ii) වාදංත්‍රයේ දක්වෙන ගායන වාදන මූලධර්ම 03 බැගින් දක්වන්න.

(iii) දඹදෙනි යුගයේ දී ලැබෙන සංගීතමය තොරතුරු අතර පිළිගත හැකි කරුණු මොනවා ද?

(iv) අනුරාධපුර යුගයේ දී ශ්‍රී ලංකාව තුළ කිසියම් ආකාරයක ගායන වාදන තිබූ බවට සංගීත මූලාශ්‍ර කරුණු ඉදිරිපත් කරන්න. (ල.20)

www.artsapi.lk